පානදුරSri Sumangala College - Panadura පානදුර
Sri Sumangala College - Panadura

ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර

Sri Sumangala College - Panadura

ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු

1st Term Test - March 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade } 11 | විෂයය Subject } සිංහල | පත්‍රය Paper } I.II | කාලය Time } පැය 02 |

නම :- ..............................................................................  පංතිය :- ..........................

## I කොටස

සැලකිය යුතුයි :-

- සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ඉරි ඇඳි කොටසේ අදහසට වඩාත් සමීප අදහස දෙන කොටස දී ඇති පිළිතුර ඇසුරින් තෝරන්න.

---

01. ඕල්කට්තුමා දේශීය වීරවරයන් සමඟ **<u>අත්වැල් බැඳාගන</u>** බෞද්ධ ප්‍රබෝධය වෙනුවෙන් ක්‍රියා කළේය.
   1. අතට අත දී   2. එකට එක් වී   3. සුබ පතා   4.අතේ දුරින් සිට

02. අමල්ගේ විභාගය වෙනුවෙන් කළ වියදම් **<u>ගල මතු පිට වී වැපුරුවා වැනි</u>** යැ යි පියා බැණ වැදුණේය.
   1. ගලෙහි මඩ දමා වී වැපිරීම   2. අකටයුත්තක් කිරීම
   3. එලක් නොලැබිය හැකි වැඩක් කිරීම   4. බලාපොරොත්තු ඉටු නොවීම.

03. **<u>අඳුනන බල්ලන්ගේ බිරීම</u>** ගණන් නොගත යුතු බව මව කීවාය.
   1. හිතවත්කම්.   2. සෝෂා කිරීම්   3. බොරු තර්ජන කිරීම්.   4. වෛර කිරීම්.

➢ **අංක 04 සිට 06 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට වඩාත් සුදුසු වචනය තෝරන්න.**

04. ජාත්‍යන්තර අත්දැකීම් ඇති මහාචාර්යවරයා තම සාරගර්භ දේශනය පැවැත්වීමට සභාගැබට .......................................... විය.
   1. අවතීර්ණ   2. උත්තීර්ණ   3. ආවීර්ණ   4. සංකීර්ණ

05. පැරණි දළදා පෙරහැර ...................................... ප්‍රදර්ශනයට වඩා රාජ්‍ය බලය පෙන්වීමේ අවස්ථාවක් වූ බව පැරණි වාර්තා පිරික්සීමේ දී පෙනී යන කරුණකි.
   1. මූලිකාංග   2. සංස්කෘතිකාංග   3. සර්වාංග   4. විශිෂ්ටාංග

06. අධ්‍යාපනය ලබා දීම සඳහා මහා සංඝයා වහන්සේ උපයෝගී කරගත් ......................... මගෙත් සෙසු සම වයස් අයගේත් සිත් තදින් ඇඳ ගති.
   1. උපේක්ෂාව   2. උද්ධරණය   3. ක්‍රමවේදය   4. ආවේදනය

07. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   1. අභිකුන්ඨික , ජ්‍යොතිෂය , තැනිතලාව , තාක්ෂණය   2. අර්භුදය , පාතාලය , සීග්‍රසාමී , පිලිවෙළ
   3. අශික්සිත , කේද්වාජකය , දළදාව , වීරෝධාර   4. දර්පණය , අවනද්ධ , දශකය , ආඝ්‍රාණ

08. තාලුජ අක්ෂරයක් , ඕෂ්ඨජ අක්ෂරයක් , දන්තජ අක්ෂරයක් , කණ්ඨජ අක්ෂරයත් පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
   1. ත , ට , හ , ළ   2. බ , ශ , බ , ඞ   3. ච , ළ , ව , අ   4. ඊ , ම , ධ , ග

09. වර්ගාක්ෂර ගණයට ඇතුළත් නොවන අක්ෂර සහිත වරණය තෝරන්න.
1. ෂ , ළ , හ , ස , ශ    2. ණ , ඩ , ට , ඨ , ඨ    3. ග , ක , බ , ස , ඞ    4. හ , එ , ප , ම , බ

10. උක්ත නාම පද පමණක් ඇති වරණය තෝරන්න.
1. මඩුවකු , කාන්තාවක් , නයි , මුගටින්    2. බැල්ලක් , කුනිස්සෙක් , නරි , කොවුල්ලු
3. ඔවුන් , ගංගාවෝ , දරුවන් , කුරුල්ලකු    4. මාලිගාවෝ , වැද්දන් , පිහිණුම්කරුවෝ , ජලධාරා

11. උපසර්ගයක් රහිත පදයක් ඇති වරණය තෝරන්න.
1. සුබස , උපචාරා , ප්‍රතිචාර , සතොස    2. නිකෙලෙස් , නොමනා , අසනීප , අබිදම්
3. අදියුරු , අබියෙස් , විපුල , කුදිටු    4. ඉකුත් , පබල , උදුල් , පසක්

12. ජීවිතය ඇතිතාක් කල් යන්නට තනිපදය වන්නේ,
1. සදාකාලික    2. යාවජීව    3. දිවිකල්    4. සදාතනික

- **ඉරි ඇඳි පද කවර ව්‍යාකරණ ගණයට අයත් දැයි තෝරන්න.**

13. <u>**නැණවතකු**</u> වූ ඔහු රට බමහත් කීර්තියක් ගෙන දුන්නේය.
1. කෘදන්ත පද    2. යුගල පද    3. තද්ධිත පද    4. විශේෂණ පද

14. ඇතුගල්පුර <u>**හෙවත්**</u> කුරුණෑගල අතීත රාජධානියකි.
1. තද්ධිත    2. කෘදන්ත    3. උපසර්ග    4. නිපාත

15. ආකාරාදී පිළිවෙළ අනුව නිවැරදි වාක්‍ය තෝරන්න.
1. අම්බලන්ගොඩ , එප්පාවල , උඩගම , ඕපනායක , ඉත්තෑපාන
2. ඉත්තෑපාන , ඕපනායක , අම්බලන්ගොඩ , එප්පාවල , උඩගම
3. අම්බලන්ගොඩ , ඉත්තෑපාන , උඩගම , එප්පාවල , ඕපනායක
4. අම්බලන්ගොඩ , උඩගම , ඉත්තෑපාන , එප්පාවල , ඕපනායක

16. පද බෙදීම වඩාත් නිවැරදිව යෙදී ඇති වචනය තෝරන්න.
1. පිරිසිදු ජලය පානය කිරීමෙන් සෞඛ්‍යය තත්වය යහපත් වේ.
2. ගොවියෝ ද කම්කරුවෝ ද රට සංවර්ධනයට එක සේ තම ශ්‍රමය වැය කරති.
3. අපි අසල් වැසියන් සමඟ සාම දානයෙන් ජීවත් වෙමු.
4. අපගේ අරමුණ ස්වයං පෝෂිත ලංකාවක් බිහි කිරීමයි.

17. නිවැරදි විසන්ධි පමණක් යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. ශිල්පා + ආයතනය , මහින්ද + ආගමනය , කාල + උචිත , වී + වග
2. වීර + උදාර , පර + උපකාරය , ජාතික + අභිමානය , පස් + ඉදුරන්
3. විද්‍යා + අනුකූල , ශාස්ත්‍ර + උද්ග්‍රහණය , මහ + බික්මන , අති + උත්තම
4. චම් + ඇස , සර්ව + අංග , දළ + ස , චන්ද්‍ර + ලෝකය

18. මුලින් දී ඇති පදයට සමාන අර්ථයක් දෙන පදයක් ඇතුළත් නොවන පේළිය තෝරන්න.
1. කාංචන - මිණි , රුවන් , රත්න , රජක
2. නිමේෂය - මොහොත , වේගය , තප්පරය , ප්‍රවාහය
3. රජස් - රජු , නිරිඳු , දූවිලි , රාජ්‍යය
4. මිහිලොල් - මී පැණි , මී මැස්සා , මිහිකත , රජු

19. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
1. සංකීර්ණ - ව්‍යාකූල , සරල , කෙටි , ආකුල
2. අනුලෝම - විලෝම , ප්‍රතිලෝම , අනුකරණ , අනුරූප
3. නිබඳ - නිතර , නිරන්තර , නිති , නිරතුරු
4. සංවෘත - ප්‍රාකෘත , විරල , විවෘත , ආවෘත

20. අසම්භාව්‍ය ක්‍රියාවක් යෙදී ඇති වාක්‍ය තෝරන්න.
1. මාමා ඔහුලවා ඇඩ කරවයි.    2. මම සුවපත් වෙම්මා
3. අත සෙලෙව්වොත් කට සෙලවිය හැකි වෙයි.    4. ලෙඩා කෙඳිරි ගායි.

21. යුගල පද පමණක් ඇති පද පේළිය තෝරන්න.
    1. සද්ද බද්ද , වංහුං , ළමයි බමයි , ඔප්පු තිරප්පු
    2. උකුළු මුකුළු , හොඳගති , නැණ නුවණ , ගණන් හිලව්
    3. ලී දඬු , වගතුග , මව්පිය , ආටක නාටක
    4. කල්ගිය , තාන්නමාන්න , සල්ලිබාගේ , අහර දහර

22. නටමින් , දුවමින් , වැද්දා , මල යන පදවල නාම ප්‍රකෘති සහ ධාතු ප්‍රකෘති පිළිවෙලින් ඇති වරණය තෝරන්න.
    1. නටා , දුවා , වැද්දා , මල
    2. නටා , දුවා , වැදි , මල
    3. නට , දුව , වැදි , මල්
    4. නට , දුව , වැද , මල

23. බහුවර්ථ පදයක් යෙදී නැති වරණය තෝරන්න.
    1. ගත - ග්‍රන්ථය , සිරුර , ගතහොත් , ගාත්‍රය
    2. දන - මිනිස්සු , දානය , ධනය , දැවිල්ල
    3. නද - නාදය , ඝෝෂාව , රාවය , ශබ්දය
    4. වර - උතුම් , වාරය , අවසරය , මුහුණ

24. විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන්නේ කුමක් ද?
    1. ආකර්ෂණ - විකර්ෂණ
    2. ශිථිල - දෘඪ
    3. ප්‍රපාතය - මස්තකය
    4. පැණසර - විදග්ධ

25. අක්ෂර ගැළපීමෙන් සැකසෙන නිවැරදි ග්‍රන්ථ නාමය සහිත වරණය වන්නේ කුමක් ද?
    1. යගරාවිය
    2. නුතුතරිවක්
    3. මදේද්බැගට
    4. යළිපෙගරමග

26. අනුනාසිකා ශබ්ද පමණක් පිළිවෙලින් යෙදී ඇති වරණය තෝරන්න.
    1. ඞ , ළ , ණ , න , ම
    2. න , ණ , හ , ත , ම
    3. ඞ , ඤ , න , ම
    4. න , ඤ , ට , හ , න

27. ආගම සන්ධියට උදාහරණයක් නොදෙන පදය කුමක් ද?
    1. සුවාසු
    2. දෙවුර
    3. පුනරුත්
    4. සුදම්

28. වැරදි අදහස සහිත වරණය කුමක් ද?
    1. සෝපද්‍ර යනු නිරුපද්‍ර යන වචනයෙහි විරුද්ධාර්ථ පදයයි.
    2. උපසර්ග වාක්‍යයක ඕනෑම පදයක අගට යෙදේ.
    3. චීවරධාරියා යනු තද්ධිත ප්‍රත්‍යක් ඇති පදයකි.
    4. මූ මුත් යනු සර්වනාම පද වෙයි.

29. උදව් කළ අයම තමාට හතුරුකම් කිරීම ,
    1. බිත්ති වලටත් කන් තියෙනවාලු.
    2. කුඩම්මත් ඇවිත් වුම් පුංචි කළා වගේ.
    3. කළ හොඳ පස්සෙන් එළවනවාලු.
    4. ඉඟුරු දීලා මිරිස් ගත්තා වාගේ

30. බාහිර පෙනුමෙන් මිනිස්සු මනින්න අපහසුය.
    1. බඩ ලොකු උණාට මුදලාලි වෙන්නේ නැලු.
    2. පණ්ඩිතයන්ට ඒදණ්ඩෙන් යන්න බැරුවා වගෙයි.
    3. ගැරඬියා පෙනේ පුප්පන්න හදනවා වගේ.
    4. බඩේ ඉන්න දරුවට හඳහන් හදනවා වගේ.

31. ප්‍රශ්නයකට මුල පුරන්න බලා සිටින්නෙකුට ඊට හේතු කාරඑක දෙයක් කිරීම
    1. අළු යට හැංගුණු ගිනි පුපුරු වගේ
    2. ඇඹිල්ල දාන්න දුන්නහම ඔළුවත් දාගන්නවා වගේ
    3. එක පතේ කකා බොටුව කපනවා වගේ
    4. අඬන්න ඉන්න කෙනාගේ ඇහැට ඇඹිල්ලෙන් ඇන්නා වගේ

32. පූලා සුවඳ මල් වුල් කැරු වරල් බැඳ
    1. සුවඳ මල් තැන තැන විසුරුවා
    2. පිපුණු සුවඳ මල් ගැසීමෙන් කොණ්ඩය අවුල් කරා
    3. පිපුණු සුවඳ මල් මාලයක් කරේ දමා
    4. පිපුණු සුවඳ මල් මාලාවක් සාදා කොණ්ඩයෙහි බැඳ

33. සුරත් තඹරු පෙති සෙ නෙතින්
   1. අත් දෙක නෙළුම් පෙති වාගේය
   2. ඇස් දෙක නෙළුම් පෙති වාගේය
   3. රතුපාට නෙළුම් පෙති ඇස් දෙක වාගේය.
   4. ඇස් දෙක රතුපාට නෙළුම් පෙති වාගේය

34. ලුහු , ගුරු යනුවෙන් හඳුන්වන්නේ,
   1. අකුරේ වට ප්‍රමාණ හැඩයයි
   ඉ2.අකුරක මාත්‍රාවල පිහිටීමයි
   3. අකුරක දිග සහ කෙටි ස්වරූපයයි
   4. අකුරක කෙටි සහ දිග් ස්වරූපයයි.

35. ශුද්ධ සිංහල හෝඩියෙහි ගාත්‍රාක්ෂර ගණන කීය ද?
   1. 32 කි
   2. 30 කි
   3. 20 කි
   4. 18 කි.

36. ළ , ඥ අක්ෂර දෙකෙහි සම්මිශ්‍රණ සංයෝගය වන්නේ,
   1. ල් , උ , ජ් , ඤ
   2. ළ් , උ , ජ් , ඤ
   3. ළ් , උ , ජ් , ඥ
   4. ළ් , ශු , ජ් , ණ

37. පවතින ස්වභාවය ඉක්මවා යම් කිසිවක් ගැන කෙරෙහි වර්ණය
   1. උපමාලංකාරයයි.
   2. ස්වභාවෝක්ති අලංකාරයයි
   3. රූපකාලංකාරයයි
   4. අතිශයෝක්ති අලංකාරයයි.

- **ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.**

38.
   1. මිනිසුන් සත්‍යගරුක විය යුතු ය.
   2. සොරු ගෙය බිඳිතියි ගෙහිමියා සිතයි.
   3. සිසුහු නීතිරීති පිළිගනු මැනවි
   4. අපි යහපත් මිනිස්සු සේ හැසිරෙමු.

39.
   1. සියලු බෞද්ධයන් පස් පවින් වැළකෙන්නෝ ද?
   2. ඔවුහු අනාගත පුරවැසියන් ය.
   3. ගුරුවරු ළමයින් කැටුව ප්‍රදර්ශනය නැරඹීමට ගියහ.
   4. අද බොහෝ ශිෂයයෝ විදුහලට පැමිණ නැත.

40.
   1. ශ්‍රී කාන්තා තොමෝ යස ඉසුරු ගෙන දෙති.
   2. අපි ගිලනුන්ට උවටැන් කරනු වටී.
   3. කොක් රැන අහසෙහි මනහර සිතුවමක් මැවීය.
   4. මා දේශනය පවත්වද් දී ඇතැමෙක් අවධානයෙන් ඊට සවන් දුන්හ.

## II කොටස

සැලකිය යුතුයි :-

- සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

### 01) පහත දැක්වෙන අංක 1 සිට 10 තෙක් ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන වාක්‍ය ව්‍යාකරණානුකූලව නිවැරදි කර ලියන්න.
   අ) අලුතෙන් ගෙන ආ බෝනික්කා දුටු නංගීගේ සිත ඔකඳ වුවාය.
   ආ) ගෙහිමියෝ නිදද්දී සොරු ගෙට ඇතුළු වූහ.

2. එක් එක් අක්ෂර කාණ්ඩ ඇතුළත් අක්ෂර වර්ගය නම් කරන්න.
   අ) ප ඵ බ භ ම
   ආ) ක ඛ ග ඝ ඞ

3. සාහිතය යන්නෙන් සෑදෙන තද්ධිත පදය සාහිත්‍යය නම් පහත දැක්වෙන නාම ප්‍රකෘති පදවලින් සෑදෙන පද ලියන්න.
   අ) කුශල -
   ආ) සුන්දර -

4. මොනරාගල ප්‍රදේශයේ පහත සඳහන් පද සඳහා භාවිතා වන වචන ලියන්න.
   අ) නිදාගත්තා - ආ) විසිකළා -

5. පහත සඳහන් වාක්‍ය කර්මකාරයට හරවන්න.
   අ) ඉංජිනේරුවා ප්‍රදර්ශනය සඳහා අපූරු නිර්මාණයක් ඉදිරිපත් කළේය.
   ආ) නිලධාරිහු සේවකයන් ඇගයීමට ලක් කළහ.

6. පහත යෙදුම්වල පළමු පදය හා දෙවන පදය අතර නොගැලපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු පදය සකස් කරන්න.
   අ) ප්‍රවෘත්ති පත් ආ) ක්‍රීඩා බිම

7. ආකාරාදී ක්‍රමයට වඩාත් හෝ මාතෘකා පාඨ පෙළ ගැසූ වූ කෝෂ ග්‍රන්ථ 2ක් ලියන්න.
   අ) ............................................ ආ) ............................................

8. පහත සඳහන් පද වලට විරුද්ධ පද ලියන්න.
   අ) අනිවාර්ය - ආ) ආමෝදය -

9. පහත සඳහන් පද අයත් සන්ධි වර්ගය නම් කරන්න.
   අ) ගම්පොළ - ආ) මල්ලත්ත -

10. පහත සඳහන් ඉරි ඇඳි පද අයත් ව්‍යාකරණ වර්ගය නම් කරන්න.
   අ) ආනන්ද කුමාරස්වාමි <u>සුප්‍රකට</u> කලා විචාරයෙකි.
   ආ) කොරෝනා වෛරසය <u>නිසා</u> මුළු ලොවම බියෙන් ඇලලී ගොසිනි.

## 02) පහත අ , ආ , ඉ , ඊ අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නොඅඩු රචනයක් ලියන්න.

**අ)** පරම්පරානුගත ව පැවතෙන නර්තන , වාදන , රංගන , ආදී අංග රාශියකින් සහ ඉපැරණි චාරිත්‍ර වාරිත්‍රවලින් සමන්විත පෙරහැර මංගල්‍යය ශ්‍රී ලාංකේය අනන්‍යතාවය ඉස්මතු කෙරෙන උත්සවයකි. අතීතයේ සිට පවත්වාගෙන එන මෙම හර පද්ධතීන් රැක ගැනීමට මෙම සංස්කෘතික උත්සවයෙන් මහත් පිටුවහලක් ලැබෙයි. ඇසළ මස පැවැත්වෙන දළදා පෙරහැර විවිධ ආගම් අතර සහජීවනය පතුරුවන චාරිත්‍ර වාරිත්‍ර සහිත උත්සවයකි. අප මෙවන් සංස්කෘතිකාංග රැක ගත යුතුය.

**ආ)** විද්‍යාව හා තාක්ෂණය බලපෑමෙන් ලෝකය අද එකම ගම්මානයක් බවට පත්ව තිබෙයි. අජටාකාශතරණය හදවත් බද්ධ කිරිම ආදිය අපට ලැබී තිබෙන්නේ විද්‍යාවෙහි සහ තාක්ෂණයෙහි බලමහිමයෙනි. ඒ අතර ම න්‍යෂ්ටික අවි , තාරකා යුද්ධ , මිසයිල ප්‍රහාර ආදිය ගැන අසන්නට ලැබෙයි. මෙම නිසා විද්‍යාව සහ තාක්ෂණවේදය මානව අභිවෘද්ධිය සඳහාම විය යුතු ය.

**ඉ)** රූපවාහිනිය , ගුවන්විදුලිය , පුවත්පත් ආදි සාමාන්‍ය ජනයා අතර පවතින ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් තුළින් ජනතාව බලාපොරොත්තු වන්නේ නිවැරදි තොරතුරු , සාරධර්මයන්ගෙන් පිරි ලිපි සහ සිදුවීම්ය. නමුත් අද වනවිට මෙම සන්නිවේදන මාධ්‍යන් තුළින් සමාජ විරෝධි ළමා මනසට නොගැළපෙන හොර , වංචා ආදී සිදුවීම් එළි දැක්වෙයි. මේවායෙහි ඇති බරපතල බව වන්නේ එවැනි ක්‍රම අනුගමනය කරමින් වැරදි මගට අවතීර්ණ වීමට සමාජයෙහි යම් පුද්ගලයන් උත්සහ දැරිමයි. මේ සඳහා වාරණ නීති පැනවීමට හැකිවිය යුතුය.

**ඊ)** කලින් කලට ලොව පුරා පැතිරෙන වසංගත රෝග ලෝක ප්‍රජාවගේ සෞඛ්‍යයට මෙන්ම සංවර්ධනයට ද ප්‍රබල තර්ජනයකි. එවැනි සවංගත= තත්ත්වයන් ඇති වූ ක්ෂණිකයෙහිම මැඩ පැවැත්වීමට කටයුතු යෙදීම සෞඛයය අංශ වල ප්‍රධාන වගකීමකි. පූර්ව සූදානම , අඛන්ඩ නිරීක්ෂණය සහ පසු විපරම මගින් වසංගත රෝග පැතිරවීම වළක්වාගත හැකි වෙයි.

**03)** **පහත දැක්වෙන උද්ධෘත කියවා , එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වනසේ සාරාංශ කොට ලියා , සාරාංශ අග , වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.**

අධ්‍යාපනයට ගරු කරන එක ම දේශපාලන සහ සමාජ පිළිවෙත නම් ප්‍රජාතන්ත්‍රවාදයයි පවසා ඇත. පුරවැසියන්ගේ යුක්තිගරුක හා සුපරිචිත සිත්සතන් ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන බැවින් නූගත් ජනතාවක් අතරේ පහළ වන ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන සිතීමට පවා නොහැකි ය. වැඩෙන පරම්පරාවේ සිතුම් පැතුම් නිවැරදි මං ඔස්සේ යොමු කිරිම සඳහා විශේෂයෙන් සැකසුණු අධ්‍යාපන ක්‍රමයක් සංවර්ධනය කිරිමෙන් ප්‍රජාතන්ත්‍රවාදී රටක් සිය ආරකසාව සලසා ගැනීම වැදගති. ප්‍රජාතන්තුවාදී රටක අධ්‍යාපන ප්‍රතිපදාවේ ප්‍රධාන කාර්යය වනුයේ ශිෂයා සමාජයට පා තබන අවධියේ දී එහි සංකීර්ණභාවය අවබෝධ කර ගැනීමට උපකාර වන පරිදි එය සරලව ද , නිශ්චිතව ද ඔහුට ඉදිරිපත් කිරිම ය.
ප්‍රජාතන්ත්‍රවාදී රට වලට සෑම පෙරමුණකින් ම තර්ජන එල්ල වන ලෝකයක ජීවත් වන අප දරුවනට ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන පිළිවෙළ පමණක් අවබෝධ කර දීම ප්‍රමාණවත් නොවේ. ඊට ඇලුම් කිරිමටත් ඒ ගැන උදම් වීමටත් බැලු බැල්මට දක්නට ලැබෙන එහි ව්‍යාකූලත්වය තුළින් පෙනෙන උත්කෘෂ්ට ආදර්ශ සහ හරය වටහා ගැනීමටත් අපගේ ගැටල් ලුහුඬින් නිරාකරණය කලත් ඉතා හානිකර , ප්‍රජාතන්ත්‍ර විරෝධී කෙටි මාර්ග අනුගමනය කිරීමෙන් වැළකී සිටිමටත් ඔවුනට ඉගැන්විය යුතුය. මේ අනුව ප්‍රජාතන්ත්‍රවාදී රටක අධ්‍යාපනය ආරම්භයේ පටන් අවසානය දක්වා ම සජීව ක්‍රියාකාරී අත්දැකීම් විය යුතු ය.

04) **පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**.

ලංකාවේ නිෂ්පාදනය කරන ලද චිත්‍රපටි බොහෝමයක් ම රටේ සංස්කෘතික වටිනාකමට අනර්ථකාරී අයුරින් බල පා ඇත. ඒවා වෙළඳ භාණ්ඩ වශයෙන් සාර්ථක වු ඉන්දීය චිත්‍රපට වල හුදු පිටපත් ය. ඒවා භාෂාව කෙලෙසා ප්‍රේක්ෂකයාගේ පහත් ම රුචිකත්වයට තුඩු දෙමින් නිසරු විනෝද ලොවකට පිවිසීමට ඉඩ ලබා දෙයි. දේශීය කලාකරුවනට ඔවුන්ගේ කුසලතා දියුණු කර ගැනීමේ නියම අවස්ථා නො සැලසිණි. එ පමණක් නොව ඔවුන් සතු ඕනෑ ම දක්ෂතාවක් ඉන්දීය ශිල්පීන්ගේ හුදු පිටපත් බවට හැරවීමට සිදු විය.

සමීපස්ථ ඉන්දියාව වැනි විශාල රටක් හා තරඟයකට මුහුණ පෑමට සිදු වී තිබෙන හෙයින් ලංකාවේ තුරුණු කලා ද විශිෂ්ට සංස්කෘතිය ද නො නැසී පවත්වා ගැනීමට ලක් රජය විසින් යම් ප්‍රමාණයක ආරක්ෂාවක් සැලසිය යුතුය. මේ රටේ රුචිකත්වයත් රසිකභාවයත් නොදැනුවත්ව ම නොකඩවා ම විනාශයේ ප්‍රපාතයට යන ගමන වැලැක්විය හැක්කේ එවැනි පියවරකින් පමණි. මෙම දුෂ්කර කටයුත්තේ බරපතළ කම සුළු කොට තැකිය නොහේ. අප කැමති වුව ද නොවුව ද නිර්දය වේගයෙන් වෙනස් වන නාගරිකත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් කලාව බහුජන සංස්කෘතියත් , සුළු ප්‍රභූ සංස්කෘතියත් , වශයෙන් දෙ අන්තයකට යාම නොවැළැක්විය හැකි වනු ඇත. නාගරික සංස්කෘතියේ නිෂ්පාදනය වන චිත්‍රපටය මේ දෙඅන්තයේ ගමනයෙන් වැඩියෙන්ම අභාෂය ලබයි. නවීනතම පර්යේෂණාත්මකව සිනමාවත්, නොසැබි සිනමාවත් , මහජන ප්‍රසාදයෙන් ඈත් වීම මීට සාධකයකි.

**අ)** ලංකාවේ නිෂ්පාදිත චිත්‍රපටි බොහොමයක් රටේ සංස්කෘතික වටිනාකමට අනර්ථකාරි අයුරෙන් බලපෑ බව තහවුරු කෙරෙන නිදසුන් දෙකක් දක්වන්න.

**ආ)** දේශීය කලා කරුවන්ගේ දක්ෂතාවලට මෙහි දී සිදු වූයේ කුමක් ද?

**ඉ)** ලක් රජය කිසියම් ප්‍රමාණයක් ආරක්ෂාවක් ලබා දිය යුතු යැයි මේ ලේඛකයා පවසන්නේ කවර කාර්යයක් උදේසා ද?

**ඊ)** මහජන ප්‍රසාදයෙන් දුරස්ථ වු චිත්‍රපට වර්ග නම් කරන්න.

**උ)** චිත්‍රපටිය වැඩියෙන් අභාසය ලබන අන්ත දෙක දක්වන්න.

05) සමන්පුර තුරුලිය ගම ගම්වාසීන්ගේ එකතුවෙන් ''ස්වශක්ති'' නමින් ප්‍රජා සමිතියක් ආරම්භ කොට ඇත. එම සමිතියේ සමාජිකයන්ගේ ශ්‍රම දායකත්වයෙන් ගමේ පවත්නා සුලබ අමු ද්‍රව්‍ය සුළු ගනිමින් සුළු කර්මාන්තයක් ආරම්භ කොට පවත්වාගෙන ඒම ද සුවිශේෂත්වයකි. එම කුඩා කර්මාන්තයට ආධාර හා උපදෙස් ලබා ගැනීම සඳහා කොළඹ පැලේ විදීයේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවට ලිපියක් ලියන්න. සමිතියේ ස්වභාවය, සුළු කර්මාන්තය, අමු ද්‍රව්‍ය භාවිතඉය, නිෂ්පාදන භාණ්ඩ , අලෙවිය, ඉදිරි ඉලක්ක ආදීය පිළිබඳ සැලකිලිමත් වන්න.

**නැතහොත්,**

මේ සාහිත්‍ය මාසය වෙනුවෙන් ''සපුමල්'' පොත්හල මගින් විශේෂ වට්ටම් ලබාදෙන බව දන්වා මහ ජනතාව දැනුවත් කීරිමට අත් පත්‍රිකාවක් සකසන්න.